# ලොවම පිළිගත් වෘත්තීමය රසායන විද්‍යාඥයකු වීමට මහඟු අවස්ථාවක්

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය 1972 දී පාර්ලිමේන්තු පනත් අංක 15 යටතේ ස්ථාපනය කරන ලදී. මෙය 1941 දී පිහිටුවන ලැබූ රසායන විද්‍යා සංගමයට අනුබද්ධව පිහිටුවා ඇත. 2016 වසරේ දී එහි 75 වන වසර සමරනු ලැබීය.

රාජගිරිය රසායන විද්‍යාආයතනය මඟින් 39 වෙනි වරට පවත්වනු ලබන වර්ෂ 4 ක රසායන විද්‍යා උපාධි පාඨමාලාව සඳහා ද 44 වෙනි වරට පවත්වනු ලබන වර්ෂ 2 ක රසායන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ද අයදුම්පත්කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාවල විශේෂත්වය වන්නේ

- අංග සම්පූර්ණ දේශනමාලා
- අංග සම්පූර්ණ රසායනාගාර පහසුකම්
- පුස්තකාල පහසුකම්
- විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම්
- පශ්චාත්උපාධිය සඳහා දේශිය හා විදේශීය ශිෂ්‍යත්ව ලබාගැනීමේ හැකියාව

1996 සිට ශ්‍රී ලංකාවේ බිහිවුණු රසායනඥයන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් බිහි කරන ලද්දේ මෙම ආයතනය මඟිනි. මේ සඳහා සම්පත්දායකයන් වන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ආචාර්ය හා මහාචාර්යවරු, පර්යේෂණ ආයතන වල නිලධාරීහු, ලංකාවේ රජයේ හා පෞද්ගලික අංශයේ කර්මාන්ත ශාලාවල රසායනඥයෝ සහ ඉංජිනේරුවරු වෙති.

පසුගිය අවුරුදු 30කට වැඩි කාලයක් තුළ පවත්වනු ලැබූ මෙම වසර හතරේ රසායන විද්‍යා උපාධි පාඨමාලාව ලෝකයේ අනෙකුත් විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන රසායන විද්‍යා විශේෂ උපාධියට සමාන වේ. බ්‍රිතාන්‍යයේ රසායන විද්‍යා ආයතනය මඟින් මේ පාඨමාලාව ඇගයීමට ලක් කර එය ජාත්‍යන්තර තලයේ පාඨමාලාවක් බවට පිළිගෙන ඇත.මෙම පාඨමාලාවෙන් පසු ලබාගත් පශ්චාත් රසායන විද්‍යාත්මක පළපුරුද්ද අනුව වරලත් රසායන විද්‍යාඥයකු ලෙසට ලියාපදිංචි විය හැකිය.

මේ දුරකථන අංකවලට ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකිය 0112 861231, 0114615230